සේවක අර්ථසාධක අරමුදල - 2024
----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සේවක අර්ථසාධක අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, සාමාජිකයන්ගේ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සඳහා වූ ක්ෂය ගණනය කිරීමේ උප ලේඛනය අනුව, සම්පූර්ණයෙන් ක්ෂය අවසන් කර තිබූ ස්ථාවර වත්කම්වල වටිනාකම කම්කරු දෙපාර්තමේන්තුවට හා ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශයට අදාලව පිළිවෙලින් රු.මිලියන 696ක් හා රු. මිලියන 160ක් විය. එම වත්කම් අතරින් තවදුරටත් භාවිතා කරනු ලබන වත්කම් හඳුනාගෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය සමාලෝචනය නොකිරීමෙන් සිදු වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව නිවැරදි කිරීමටත් තවදුරටත් භාවිතයට ගනු නොලබන වත්කම් සුදුසු පරිදි අපහරණය කිරීමටත් කටයුතු කර නොතිබුණි.	සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වූ ස්ථාවර වත්කම් සඳහා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව නිවැරදි කිරීමටත්, අවශ්‍යතාවය මත ජංගම නොවන වත්කම්හි ඵලදායි ජීවිත කාලය සමාලෝචනය කොට එම ගිණුම්කරණ ඇස්තමේන්තු මත වත්කම් වල මූල්‍ය අගයන් වාර්තා කිරීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියා මාර්ග ගැනිමට සැලසුම් කර ඇති බව.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව කටයුතු කල යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අරමුදල විසින් පවත්වාගෙන යන බැංකු ගිණුම් 09කට අදාලව 2024 දෙසැම්බර් 31 දිනට සකස් කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශන අනුව 2001 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදයට අදාලව මුදල් පොතේ සටහන් වූ නමුත් බැංකු ප්‍රකාශයේ සටහන් නොවූ ගනුදෙනු, බැංකු ප්‍රකාශයේ සටහන් වූ නමුත් මුදල් පොතේ සටහන් නොවූ ගනුදෙනු, අගරු වූ චෙක්පත්, සෘජු හර/බැර, පරිගණක ගිණුම්කරණ පද්ධතියේ දෝෂයක් ලෙස 2006 වර්ෂයේ සිට පවතින ශේෂය, තැන්පත් කල නමුත් උපලබ්ධි නොවූ මුදල් ඇණවුම් සහ චෙක්පත් හා නිකුත්කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් ලෙස ගැලපුම් කල පසු ශුද්ධ ශේෂයන්හි එකතුව රු.මිලියන 3,900ක් නිරවුල් නොකරන ලද ශේෂ	අදාල ගනුදෙනු නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සිදු කරමින් පවතින බව.	දීර්ඝ කාලයක සිට පැවත එන මෙම බැංකු ගිණුම් වල ගණුදෙනු නිරවුල් කිරීමට කළමනාකරණය අවධානය යොමු කල යුතුය.

	ලෙස පැවතුණි. ඉන් රු.මිලියන 1,581ක ශුද්ධ ශේෂයක් 2025 ජනවාරි වන විටත් නිරවුල් කර නොතිබුණි.		
(ආ)	2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව මෝටර් රථ පිරිවැය රු.මිලියන 97.20ක් ද, සමුච්චිත ක්ෂයවීම් රු.මිලියන 56.09ක් ද, ශුද්ධ අගය රු.මිලියන 41.11ක් ද විය. මෙම ශේෂයන් 2018 වර්ෂයේ සිට නොවෙනස්ව මූල්‍ය ප්‍රකාශනවල පවතින බැවින් 2018 වර්ෂයේ සිට රු.මිලියන 41.11ක් වූ මෝටර් රථ ක්ෂය ගණනය සඳහා යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය.	දැනට සේ.අ.අ අරමුදල යටතේ මිලදී ගෙන ඇති වත්කම් සම්බන්ධව දෙපාර්තමේන්තුව සතු සියළුම වාහන වල ලියාපදිංචි පොත් පරීක්ෂා කොට දෙපාර්තමේන්තුව මිලදී ගැනීමක්ද යන්න හඳුනා ගැනීමෙන් පසු ගෙවීම් තොරතුරු පරීක්ෂා කොට මිලදී ගැනුම් පිරිවැය හඳුනා ගැනීමටත්, ඒ අනුව මෙම වෙනස නිවැරදි කිරීමටත් කටයුතු කරන බව.	අරමුදලෙහි ස්ථාවර වත්කම් ක්ෂය වීම් ප්‍රතිපත්තිය අනුව ස්ථාවර වත්කම් ක්ෂය ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව මෝටර් රථ පිරිවැය රු.මිලියන 97ක් විය. විගණනය වෙත ලබා දුන් තොරතුරු අනුව සිගාස් පරිගණක මෘදුකාංගය අනුව අරමුදල සතුව පවතින මෝටර්රථ සංඛ්‍යාව 23 කි. එහි පිරිවැය එකතුව රු.මිලියන 75ක් වූ අතර රු. මිලියන 22ක වෙනසක් නිරීක්ෂණය විය.	දෙපාර්තමේන්තුවට අයත් සියලුම වාහන හඳුනාගෙන එකී වාහන අත්පත් කර ගැනීමේ වැය විෂයය අනුව හෝ පවරා දීම අනුව නිවැරදි වාහන සංඛ්‍යාව මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කල හැකිය. දැනටමත් වාහන සත්‍ය පිරිවැය සිගාස් පද්ධතිය තුලින් හඳුනා ගත හැකි අතර සමස්ත ලේඛනය තුල මෙම වාහන හඳුනා ගනිමින් නිවැරදි කිරීම් ආරම්භ කිරීමට කටයුතු කරනු ලබන බව.	මූල්‍යනය කරන සියලුම වත්කම් අරමුදලෙහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ඇතුලත් කළ යුතුය.
(ඈ)	2024 දෙසැම්බර් 31 දිනට "මෙහෙවර පියස අභ්‍යන්තර නිර්මිත සැකසීමේ නොනිමි වැඩ" ගිණුමෙහි වූ රු.මිලියන 298ක ශේෂය කාර්යාල සවිකිරීම් ලෙස ප්‍රාග්ධනිත කර ක්ෂය වීම් ගිණුම්ගත කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.	නොනිමි වැඩ ගිණුම පරීක්ෂා කර සත්‍ය ස්ථාවර වත්කම් හඳුනාගෙන ඉදිරියේදී ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලබන බව.	ස්ථාවර වත්කම් භාවිතයට ගතහැකි තත්ත්වයට පැමිණි දින සිට ප්‍රාග්ධනිත හා ක්ෂය ගණනය කිරීම කළ යුතුය.

1.5.3 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා

විෂයය	මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම (රු.මිලියන)	අනුරූපී වාර්තා අනුව වටිනාකම (රු.මිලියන)	වෙනස (රු.මිලියන)	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සාමාජික ගිණුම් ශේෂයෙහි ඇතුළත් උප ගිණුම් 5ක ශේෂය	92,069	43,907.6	48,162 (මෙහි රු.මිලියන 15,447 ක හඳුනා නොගත් වෙනසක් තිබුණි)	කේවල ගිණුම් මුදල් පදනමින් පවත්වා ගෙන යනු ලබන අතර පොදු ලෙජරය තුල ගනුදෙනු වාර්තා කරනුයේ උපචිත පදනමිනි. මේ නිසා මෙම	සැසඳුම් ප්‍රකාශන තුලින් තවදුරටත් හඳුනා නොගත් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කල යුතුය.

		පද්ධති දෙකෙහි කිසියම් දිනෙක පවතින ශේෂයන්හි ස්වාභාවිකවම වෙනසක් පවතී. පද්ධති දෙකෙහිම සාමාජික ගිණුම් ශේෂයන්හි සිදුවන දෛනික ගනුදෙනු වාර්තා වීම තහවුරු කිරීම පිණිස දෛනිකව මෙම පද්ධති දෙකෙහි ගිණුම් සසඳා ඇති බව.	

1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛ			
(i) 1999 පෙබරවාරි 11 දිනැති අංක 01/99 දරණ කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛය	(a) 2022 සිට 2024 වර්ෂය දක්වා කාලසීමාවට අදාලව ජා ඇල දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ ආයතන පරීක්ෂණ කටයුතු සිදුකර අධිභාර හා දායක මුදල් අයකර ගැනීමේ ප්‍රථම නිවේදනය නිකුත් කර අවසාන නිවේදනය යැවීමට දින 22 සිට 1250 ක් දක්වා වූ කාලයක් ගතවී තිබූ අවස්ථා 101 කට අදාලව සේවායෝජකගෙන් අයකර ගත යුතු රු.142,822,152, හිඟ දායක මුදල් හා අදාල අධිභාර මුදල් ද , රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට අදාලව දින 21 සිට 406 දක්වා කාලයක් ගත වී තිබූ අවස්ථා 111 කට අදාලව සේවායෝජකගෙන් අයකර ගත යුතු රු.66,455,624ක හිඟ අර්ථසාධක අරමුදල් හා අදාල අධිභාර අයකර නොතිබුණි.	හිඟ මුදල් අයකර ගැනීම සඳහා නිවේදන සකස් කිරීමෙන් පසු ආයතන විසින් මහ බැංකුවට සෘජුවම මුදල් ගෙවීම, ලබා දී ඇති ලිපිනයන් වැරදි වීම, නිසා පළමු නිවේදනය ආපසු ලැබීම, ලබා දී ඇති D 66 හෝ C වාර්තාවල සාමාජික නම් හා අංක නිවැරදි නොවීම, ආයතනයේ ලිපිනය නම සංශෝධනය කිරීමට සිදුවීම වැනි කරුණු හේතුවෙන් මෙම ප්‍රමාදයන් සිදුව ඇති බව.	දායක මුදල් හා අධිභාර අයකර ගැනිම සඳහා නිවේදන ප්‍රමාදයකින් තොරව යැවිම හා අදාල ක්‍රියාමාර්ග ගැනීම තුලින් සාමාජිකයින්ට ප්‍රශස්ථ සේවයක් ඉටු කල යුතුය.
	(b) අධිභාර හා දායක මුදල් අයකර ගැනීම සඳහා ප්‍රථම නිවේදනය නිකුත් කර තිබුණද, රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලයෙන්	-එම-	-එම-

		අයවිය යුතු රු.7,518,257 ක් සඳහා අවස්ථා 32ක් සහ මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයෙන් අයවිය යුතු රු.79,229,959 කට අදාලව අවස්ථා 15 කදී අවසන් නිවේදන නිකුත් කර නොතිබුණි.		
	(ii) 2000 පෙබරවාරි 10 දිනැති අංක 6/2000 දරන කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 1(IV) වගන්තිය	අරමුදලේ අධීක්ෂණ දත්ත පද්ධතියට අනුව ජා ඇල කම්කරු කාර්යාල බලප්‍රදේශයට අදාලව 2024 සැප්තැම්බර් 20 දිනට සක්‍රිය ආයතන 5199ක් හා අක්‍රිය/ වැසූ ආයතන 1159ක් ද රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාල බලප්‍රදේශයට අදාලව සක්‍රිය ආයතන 4322 ක් හා අක්‍රිය/ වැසූ ආයතන 851ක් ද, විය. දිගු කාලයකින් පරීක්ෂාවට භාජනය නොවූ ආයතන පරීක්ෂාවක් සඳහා තෝරා ගත යුතු බවට චක්‍රලේඛය මඟින් උපදෙස් ලබා දී තිබුණද 2015 වර්ෂයේ සිට විගණිත දින දක්වා යථෝක්ත ආයතන අතරින් ආයතන පරීක්ෂාවක් සිදු කර තිබුණේ පිළිවෙලින් ආයතන 1093ක් හා 1166ක් සඳහා පමණි. සමස්ථ ආයතන ප්‍රමාණයෙන් සියයට 83ක් හා සියයට 78ක් සඳහා පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.	කම්කරු නිළධාරියකු විසින් මසකට ආයතන 20ක් හෝ ඊට වැඩියෙන් පරීක්ෂා කරන අතර, එම ආයතන අතරින් අක්‍රිය ආයතන 05ක් සහකාර කම්කරු කොමසාරිස් විසින් තෝරා පරීක්ෂාවට ලබා දෙයි. මෙම පරීක්ෂණ වලදී ලබා ගන්නා වාර්තා පරිගණක පද්ධතියට ඇතුළත්ව නොතිබීම මෙයට හේතු වී ඇති බව.	දිගුකාලයකින් පරීක්ෂාවට ලක් නොවූ ආයතන පරීක්ෂවන් සිදු කර සමාජිකයන්ට ප්‍රශස්ථ සේවාවක් ලබා දීමට කටයුතු කල යුතුය.
(ආ)	1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදලේ 15 වන වගන්තිය	(a) යම් ආයතනයක සේවකයින්ට අදාල දායක මුදල් සෑම මාසයක් අවසාන වී එළඹෙන මාසයේ අවසාන දිනට පෙර අරමුදල වෙත ප්‍රේෂණය කල යුතු වුවත්, ජා ඇල, රත්නපුර හා මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාල බල ප්‍රදේශයට අයත් ලියාපදිංචි කරන ලද ආයතන පිළිවෙලින් 1104 ක් , 631ක් හා ද 6ක් ද	ලියාපදිංචි ආයතන වලින් දායක මුදල් ගෙවා නොතිබූ ආයතන හඳුනාගෙන කම්කරු නිලධාරීන් ලවා පසු විපරම් කිරීමට සුදුසු පියවර ගෙන ඇති බව	පසු විපරම් කටයුතු විධිමත්ව කළ යුතුය.

දිස්ත්‍රික් කම්කරු කාර්යාල වලට අදාලව ලියාපදිංචි කළ දින සිටම දායක මුදල් ගෙවා නොතිබුණි. මේ සම්බන්ධයෙන් පසු විපරම් කටයුතුද සිදු කර නොතිබුණි.

(b) ජා ඇල හා රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාල බල ප්‍රදේශයට අයත් ලියාපදිංචි කර ඇති ආයතන අතරින් අරමුදල වෙත 2005 වර්ෂයේ සිට අඛණ්ඩව දායක මුදල් නොගෙවූ ආයතන පිළිවෙලින් 1924 ක් හා ආයතන 1689 ක් හදුනාගත් අතර එම ආයතන කම්කරු නිලධාරීන් විසින් කාලීනව පරීක්ෂා කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 511,063ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.මිලියන 479,040 ක් විය. ඒ අනුව මෙහෙයුම් ප්‍රතිඵලයෙහි රු.මිලියන 32,023 ක වර්ධනයක් නිරීක්ෂණය විය. අරමුදලෙහි පොළී ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 12,709 කින් වර්ධනය වීමත් මූල්‍ය උපකරණවල සාධාරණ අගය ගැලපීම තුලින් රු.මිලියන 17,806ක ලාභයක් හදුනා ගැනීමත් මෙම වර්ධනයට හේතුවී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඉදිකිරීමට නියමිත හෝටල් සංකීර්ණයක් වෙනුවෙන් 2013 වර්ෂයේදී ලැයිස්තුගත නොවූ සමාගම්වල කොටස් ලෙස රු.මිලියන 5,000 ක් ආයෝජනය කර තිබූ අතර ආයෝජනය සිදු කර වර්ෂ 11 ක් ගත වී තිබුණද එම හෝටල් සංකීර්ණය ඉදිකිරීමේ කටයුතු මේ දක්වාම ආරම්භ නොවීම හේතුවෙන් ආයෝජනයෙන් කිසිදු ප්‍රතිලාභයක් අරමුදලට ලැබී නොතිබුණි.	මුදල්, ආර්ථික ප්‍රතිසංස්කරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ පවතින රාජ්‍ය ආයතන ප්‍රතිසංස්කරණ ඒකකය විසින් 2023 වසරේ ඔක්තෝබර් මස දී සමාගම විකුණා දැමීම සඳහා ආයෝජකයන්ගෙන් අභිලාශ ප්‍රකාශයන් කැඳවූ අතර, ඒ අතරින් ඉන්දියානු සහ ශ්‍රී ලාංකික සමාගම් 06 ක් 2024 වසරේ පෙබරවාරි මස වන විට සිය යෝජනා ඉදිරිපත් කිරීම සඳහා සුදුසුකම් ලබා තිබුණි. සේවක අර්ථසාධක අරමුදල	අවධානම අවම වන ප්‍රශස්ථ ආයෝජනයන් සිදු කළ යුතු අතර ආයෝජනය කළ මුදල නැවත ලබාගැනීමට කටයුතු කළ යුතුය.

		විසින් රාජ්‍ය ආයතන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය යටතේ මෙම ආයෝජනය විකුණා දැමීමට මහා භාණ්ඩාගාරය හා සාකච්ඡා පවත් වන ලදී. එසේ වුවද පසුකාලීනව මේ සම්බන්ධයෙන් කරන ලද විමසීම් සඳහා ප්‍රතිචාරයක් ලැබී නොමැති බව.	
(ආ)	සේවක අර්ථසාධක අරමුදලෙහි ලියාපදිංචි නොවී සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් මණ්ඩලයෙහි පමණක් ලියාපදිංචි වී තිබූ සේවා යෝජකයින් සංඛ්‍යාව 2024 දෙසැම්බර් 31 දිනට 22,764ක් වූ අතර එම සේවා යෝජකයන්ගෙන් එදිනට සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් මණ්ඩලයට ලැබී තිබූ දායක මුදල්වල එකතුව රු.මිලියන 505ක් විය. එයින් සේවකයින් 1ත් 10ත් අතර සිටින ආයතන 22,246ක් වූ අතර සේවකයින් 10ත් 254ත් අතර සිටින ආයතන 518ක් තිබුණි. ඒ අනුව එම සේවායෝජකයින් අතරින් අරමුදලෙහි ලියාපදිංචි විය යුතු එහෙත් ලියාපදිංචිවීම පැහැර හැර ඇති සේවායෝජකයින් හඳුනාගෙන ලියාපදිංචි කිරීම සඳහා මණ්ඩලය සමග සම්බන්ධීකරණය වී සුදුසු වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි.	සේවක අර්ථසාධක අරමුදල් පනතින් ආවරණය වන සේවායෝජකයන් හඳුනාගෙන ඔවුන්ගේ ආයතන පිහිටි ප්‍රදේශය භාර කම්කරු නිලධාරීන් ලවා එම සේවායෝජකයන් සේවක අර්ථසාධක අරමුදලට බඳවා ගැනීම සඳහා කටයුතු කරනු ලබන බව.	ආයතන දෙක අතර මනා සම්බන්ධීකරණයක් තුලින් පනත ප්‍රකාරව අරමුදලෙහි ලියාපදිංචි විය යුතු ආයතන ලියාපදිංචි කර ගැනිමට කටයුතු කළ යුතුය.
(ඇ)	අරමුදලෙහි බැංකු සැසඳුම් ප්‍රකාශනවල 2001 වර්ෂයේ සිට පැවත එන නොසැසඳුනු බැංකු ගිණුම් ශේෂ නිරවුල් කිරීම සඳහා 2020 ජනවාරි 09 වන දින පෞද්ගලික ආයතනයක් සමග ගිවිසුමකට එළඹ තිබුණු අතර ගිවිසුම්ගත දින සිට සති 08ක් තුල අවසන් වාර්තාව ඉදිරිපත් කළ යුතුව පැවතියත්, අදාළ ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු මෙම වාර්තාවේ දින වන විටත් අත්කර ගෙන නොතිබුණි. 2020 දෙසැම්බර් 31 දින වන විට ගිවිසුම්ගත මුදලින් සියයට 50ක් එනම් රු. මිලියන 1.5ක් ගෙවා තිබුණි.	මූලිකව සැලසුම්කල ක්‍රමවේදයේ ඇතිවූ ගැටළු හේතුවෙන් අපේක්ෂිත කාලය තුල අරමුණ ලඟා කර ගත නොහැකි වූ අතර ඒ සඳහා නව ප්‍රවේශයක් අනුගමනය කර මේ වන විට දත්ත යම්තාක් දුරට සපයා ගෙන 2006 සිට 2017 දක්වා ශේෂයන් නිරාකරණය කර ගැනිමේ හැකියාව සලකා බලමින් පවතින බව.	ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර ප්‍රධාන බැංකු ගිණුමෙහි පවතින ගැටලු නිරාකරණය කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට අරමුදලෙහි සාමාජික ගිණුම තුල “කම්කරු කොමසාරිස් ජනරාල්“ නමින් පැවති ගිණුමෙහි සේවායෝජකයින්ට එරෙහිව නඩු පැවරීමෙන් අයකරගෙන ශ්‍රී ලංකා මහ බැංකුවෙහි රඳවාගෙන ඇති රු.මිලියන 13,393ක් වූ මුදල, කම්කරු දෙපාර්තමේන්තුවේ පොදු තැන්පතු ගිණුමක රඳවාගෙන තිබූ රු.මිලියන 388ක් වූ මුදල, "ජංගම වර්ෂයේ දායක මුදල් අංක 01” නමින් වූ ගිණුමේ පැවති රු.මිලියන 74,849ක ශේෂය, විවිධ හේතු මත සාමාජිකයින්ට නොගෙවා රඳවාගත් ප්‍රතිලාභ හා හිමිකම් නොපෑ ප්‍රතිලාභ වශයෙන් පවතින රු.මිලියන 1,074ක් ශේෂය, ඌන හෝ අතිරික්ත දායක මුදල් වශයෙන් පවතින රු.මිලියන 2,753ක ශේෂය සහ ඌන හෝ අතිරික්ත ප්‍රතිලාභ ගෙවීම් වශයෙන් පවතින රු.මිලියන 514ක ශේෂය ලැබිය යුතු සාමාජිකයන් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. ඉහත සඳහන් සාමාජික ගිණුම්වලට බැර නොකර පවතින ගිණුම් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස 2013, 2016 හා 2017 වර්ෂවලදී රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ද නියෝග කර තිබුණි.	“සී” වාර්තා රහිතව යොමු කළ දායක මුදල් මෙන්ම අසම්පූර්ණ හෝ විෂමතා සහිත “සී” වාර්තා සමඟ යොමු කළ දායක මුදල් පැවතීම ආදී විවිධ හේතු මත මෙම ශේෂයන් කේවල ගිණුම්වලට බැර කිරීමෙහි අපහසුතා පවතී. මෙම ශේෂ නිරාකරණය කිරීම සඳහා, සාමාජික නම් හා අංක විෂමතා සහිත දායක මුදල් විස්තර වාර්තා පිළිබඳව සේවායෝජකයන් දැනුම්වත් කිරීම, දෝෂ සහිත "සී" වාර්තා සඳහා මුළු මුදල මත සියයට 2 ක අධිභාරයක් පැනවීම, මංගත ක්‍රමය හරහා මුදල් විස්තර වාර්තා රැස් කිරීම, ස්වයංක්‍රිය සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදයන් හඳුන්වා දීම ආදී ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	නිරවුල්කර නොමැති දායක මුදල් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	සේවක අර්ථසාධක අරමුදලේ ලියාපදිංචි සෑම සේවායෝජක ආයතනයක්ම දිස්ත්‍රික් කම්කරු කාර්යාලයකට හා කම්කරු නිලධාරියෙකුට වෙන්කර කාලීනව අධීක්ෂණය කල යුතු වුවද 2024 නොවැම්බර් 22 දින සේවක අර්ථසාධක අරමුදල් අධීක්ෂණ දත්ත පද්ධතිය අනුව කම්කරු දෙපාර්තමේන්තුවේ කලාප 24ට අදාලව අරමුදලෙහි ලියාපදිංචි සේවායෝජක ආයතන 81,987 කට වැඩි ප්‍රමාණයක් උප කලාපවලට වෙන් කර නොතිබුණ අතර ඉන් ආයතන 76,306 ක් සක්‍රිය ආයතන ලෙසද ආයතන 7,335 ක් අක්‍රිය ආයතන ලෙසද නිරීක්ෂණය විය. එම සක්‍රිය ආයතන වලින් ආයතන 631 ක් සඳහා පමණක් කම්කරු නිලධාරින් නම්කර තිබුණද, ආයතන 75,675 ක් සඳහා එසේ කම්කරු නිලධාරියෙකු නම් නොකිරීම හේතුවෙන් එම ආයතන සම්බන්ධයෙන් අධීක්ෂණයක් සිදු නොවන බව නිරීක්ෂණය විය.	මුල් අවධියේදී උප කලාප කේතය ඇතුළත් කිරීමකින් තොරව ලියාපදිංචි කරන ලද සියළුම ආයතනවල (පැරණි D පත්‍රද ඇතුළත්ව) උප කලාප පිළිබඳ තොරතුරු, අධීක්ෂණ දත්ත පද්ධතියට ඇතුළත් කිරීම අදාළ කම්කරු කාර්යාල විසින් සිදු කළ යුතු බවට එවකට පැවති මාණ්ඩලික නිලධාරී රැස්වීම් හා සාකච්ඡා වලදී දැනුම්වත් කර ඇති නමුදු විවිධ හේතූන් නිසා එම කටයුතු සම්පූර්ණ කිරීම සිදු වී නොමැති බව නිරීක්ෂණය වේ. තවද, ආයතන ලැයිස්තුව යාවත්කාලීන කිරීම සඳහා ලියාපදිංචි නොවූ ආයතන ලියාපදිංචි කිරීම සඳහා ව්‍යාපෘති වාර්තාවක් සකස් කර ඇති අතර ඒ අනුව කටයුතු කර තවදුරටත් මෙම ආයතන ලැයිස්තුව යාවත්කාලීන කිරීමට නියමිත බව.	තොරතුරු යාවත්කාලීන කර සමාජිකයන්ට ප්‍රශස්ථ සේවයක් ඉටුකිරිමට කටයුතු කළ යුතුය.

3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5 හා 3.6 (ඇ) ii වගන්ති ප්‍රකාර, 2024 වර්ෂයේ ටෝනර් මිලදී ගැනිමේදී ඒවා භාවිතා කරන මුද්‍රණ යන්ත්‍රවල සේවා ගිවිසුම් කොන්දේසි වලට අනුකූලව ඊට අදාලව ටෝනර් නියෝජිත ආයතන මගින් ඍජු ක්‍රමය මත මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවිය හැකිව තිබූ නමුත් මිල ගණන් කැඳවීමේදී එම නියෝජිත ආයතන නොසලකා කටයුතු කර තිබුණි.	මිලදී ගැනිම වෙළඳපොළ මිළ සැදහුම් ක්‍රමය අනුව සිදු කර ඇත. වගකීම් කාලය තුළ පවතින මුද්‍රණ යන්ත්‍ර සඳහා අදාළ නියෝජිත ආයතනයෙන් ටෝනර් මිළදීගෙන ඇති අතර අනෙකුත් යන්ත්‍ර තෝරා ගත් ආයතන වෙතින්ද මිළදී ගැනීමට තීරණය කර ඇති බව.	ප්‍රසම්පාදනයන් ප්‍රශස්ථ අයුරින් සැලසුම් කල යුතු වීම සහ සමාජික අරමුදලින් වියදම් දැරිමේදී ඵලදායි ලෙස අරමුදල් උපයෝජනය කල යුතුය.
(ආ)	2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.2 හා 5.3.4 (ආ) වගන්ති ප්‍රකාර, එකතු කළ අගය මත (VAT) බදු ලියාපදිංචි සහතික වල පිටපතක් ලංසුව සමඟ ඉදිරිපත් කල යුතු බව දක්වා තිබූ නමුත් 2024 වර්ෂයේදී ඒ සඳහා ලියාපදිංචි නොමැති සැපයුම්කරුවන් දෙදෙනෙකුගෙන් ඒකක 550ක් වූ ටෝනර් වර්ග 06ක් රු.7,507,500කට මිලදී ගෙන තිබුණි. එමෙන්ම භාණ්ඩ සැපයිම සඳහා නිසි බලයක් ලංසුකරුට පවරා ඇති බව පෙන්නුම් කෙරෙන නිෂ්පාදකයාගේ අධිකාරියක් තිබේද යන්න පරික්ෂා කිරීමකින් තොරව 2024 වර්ෂයේදී නිෂ්පාදකයාගේ අධිකාරියක් නොමැති සැපයුම්කරුවන් තිදෙනෙකුගෙන් වර්ග 04ක ටෝන ඒකක 225ක් රු.2,702,500 කට මිලදී ගෙන තිබුණි.	වැට් ලියාපදිංචි සහතිකය ලංසු ඇගයීමේදී අදාළ කර නොගන්නා අතර, ප්‍රසම්පාදන තීරණ සඳහාද බල නොපාන බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කල යුතුය.